# 21 වන්දනා ගාථා

අප පැවිදි වූයේ සියලු දුකින් මිදී නිවන් අවබෝධ කරනු පිණිස ය. අපට ඒ සැනසිල්ල උදා කරනු පිණිස බුදුරජාණන් වහන්සේ අසංඛ්‍ය කල්ප ලක්‍ෂ සතරක් දුක් විඳි සේක. අපට උන්වහන්සේට එම ණය ගෙවිය නොහැකි ය. අප දිනකට තෙවරක් බුදුන් වඳින්නේ ඒ වෙනුවෙන් අපගේ ගෞරවය පුදනු පිණිස ය.

බුදුරජාණන් වහන්සේ රහසින්වත් පවු නොකරන, සියලු කෙලෙසුන් නැසූ, ගුණයෙන්, සීලයෙන් ඉතාම පිරිසිදු උත්තමයන් වහන්සේ ය. එබඳු පූජනීය උතුමෙකු වැඳීමෙන් පවා අපගේ දුක්, බිය, රෝග නැති වී සියලු යහපත උදා වේ. මට්ටකුණ්ඩලී කුමරු මෙන් පරලොව සුගතියෙහි උපදී.

එම වන්‍දනාව හරියට ම කෙරෙන්නේ සිත, කය, වචනය යන තිදොර ම ඊට සහභාගී කරගෙන වඳින පුදන විට ය. මල් පහන් සූදානම් කොට පිදීම කයින් කෙරෙන පූජාවයි. ගාථා කියා වැඳීමෙන් ඊට වචනය ද සහභාගී වෙයි. මේ සියල්ල සිතේ පැහැදීමෙන් ශ්‍රද්ධාවෙන් සිදු කරන විට සිතත් ඊට සහභාගී වෙයි.

එකී වන්‍දනාව සඳහා යොදා ගැනෙන ගාථා අපමණ ය. එයින් මූලික වන්‍දනා හා පූජා ගාථා අරුත් සහිත ව නිවැරදි ව කීමට අපි මෙතැන් සිට උගනිමු.

**චෛත්‍ය වන්දනාව :**

> **වන්‍දාමි චෙතියං සබ්බං - සබ්බඨානෙසු පතිට්ඨිතං**
> **සාරීරික ධාතු මහා බොධිං - බුද්ධ රූපං සකලං සදා**

භාවය

සියලු තැන පිහිටි සියලු චෛත්‍ය ද, බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේ ද, මහා බෝධීන් වහන්සේ ද, සියලු බුද්ධ රූප ද සැම කල්හි වඳිමි.

### බෝධි වන්දනාව :

යස්ස මූලෙ නිසින්නොව - සබ්බාරි විජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා - වන්දෙ තං බොධි පාදපං

භාවය

බුදුරජාණන් වහන්සේ යම් බෝධියක් මුල වැඩ හිඳ සියලු කෙලෙස් සතුරන් නැසූ සේක් ද, බුදු බවට පත් වූ සේක් ද, ඒ ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේ මම වඳිමි.

ඉමෙ එතෙ මහා බොධි - ලොකනාථෙන පූජිතා
අහම්පි තෙ නමස්සාමි - බොධි රාජා නමත්ථු තෙ

භාවය

බුදුරජාණන් වහන්සේ විසින් පුදන ලද ඒ බෝධීන් වහන්සේ මම වඳිමි. බෝධි රාජයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා.

### සත් සතිය වැඩ හුන් තැන් වන්දනාව :

පඨමං බොධි පල්ලඞ්කං - දුතියඤ්ච අනිම්මිසං
තතියං චඞ්කමනං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලඤ්ච - මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දෙ තං මුනිසෙවිතං

**භාවය**

පළමු සතිය බෝ මැඩ ද, දෙවැන්න අනිමිස ලෝචන පූජා කළ ස්ථානය ද, තෙවැන්න රුවන් සක්මන ද, සිවුවැන්න රුවන් ගෙය ද, පස්වැන්න අජපල් නුගරුක මුල ද, සවැන්න මුචලින්ද නා දරණ ද, සත්වැන්න රාජායතන කිරිපලු නුගරුක මුල ද යන බුදුරජාණන් වහන්සේ විසින් ඇසුරු කරන ලද සියලු තැන් වඳිමි.

**පහන් පූජාව :**

> ඝනසාරප්පදිත්තෙන - දීපෙන තමධංසිනා
> තිලොකදීපං සම්බුද්ධං - පූජයාමි තමොනුදං

**භාවය**

තුන්ලොව පහනක් බඳු වූ මෝහ නමැති අඳුර දුරු කරන්නා වූ ද සම්බුදුරජාණන් වහන්සේ, අඳුර දුරු කරන, කපුරු සුවඳ තෙලින් දල්වන ලද පහනෙන් පුදමි.

**සුවඳ දුම් පූජාව :**

> සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං
> සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමී තථාගතං

**භාවය**

අනන්ත වූ ගුණ සුවඳින් සුවඳවත් වූ සිරුරින් හා මුහුණින් හෙබි බුදුරජාණන් වහන්සේ මම සුවඳ වර්ගවලින් පුදමි.

**මල් පූජාව :**

> වණ්ණ ගන්ධ ගුණොපෙතං - එතං කුසුම සන්තතිං
> පූජයාමී මුනින්දස්ස - සිරිපාද සරොරුහෙ

**භාවය**

පැහැය, සුවඳ යන ගුණයන්ගෙන් යුක්ත වූ මේ මල් සමූහයෙන් බුදුරජාණන් වහන්සේගේ සිරිපා පියුම් පුදමි.

**පූජේමි බුද්ධං කුසුමේනනේන - පුඤ්ඤේනමේතේන ච හොතු මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදං මේ - කායො තථා යාති විනාසභාවං**

**භාවය**

මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදමි. ඒ පිනෙන් මට නිවන් ලැබේවා. මේ මල් මැළ වී යන්නා සේ මගේ ශරීරය ද විනාශයට පත් වන්නේ ය.

**පැන් පූජාව :**

**අධිවාසෙතු නො භන්තෙ - පානීයං උපනාමිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

**භාවය**

ස්වාමීනි, අප විසින් පිළියෙල කරන ලද, මේ පැන් ඉවසා වදාළ මැනව. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගනු මැනව.

**ආහාර පූජාව :**

**අධිවාසෙතු නො භන්තෙ - භොජනං උපනාමිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

**භාවය**

අප විසින් පිළියෙල කරන ලද මේ ආහාර ඉවසා වදාළ මැනවි. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් එය පිළිගනු මැනවි.

### අවුළුපත් පූජාව :

අධිවාසෙතු නො භන්තෙ - බජ්ජකං උපනාමිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

**භාවය**

ස්වාමීනි අප විසින් පිළියෙල කරන ලද මෙ අවුළුපත් ඉවසා වදාළ මැනවි. උතුම් වූ බුදුරජාණන් වහන්ස, අප කෙරෙහි අනුකම්පාවෙන් පිළිගනු මැනවි.

### දැහැත් පූජාව :

අධිවාසෙතු නො භන්තෙ - තාම්බූලං උපනාමිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

**භාවය**

ස්වාමීනි අප විසින් පිළියෙල කරන ලද මේ දැහැත් ඉවසා වදාළ මැනවි, උතුම් වූ බුදුරජාණන් වහන්සේ, අප කෙරෙහි අනුකම්පාවෙන් පිළිගනු මැනවි.

### කමා කිරීම :

කායෙන වාචා චිත්තෙන - පමාදෙන මයා කතං
අච්චයං ඛම මෙ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත

**භාවය**

ස්වාමීනි මහා ප්‍රාඥ වූ බුදුරජාණන් වහන්ස, කයින්, වචනයෙන් හෝ සිතින් මා විසින් පමාවකින් යම් වරදක් කරන ලද ද ඒ වරදට සමා වන සේක්වා.

## පුණ්‍යානුමෝදනා

### දෙවියන්ට පින් දීම :

එත්තාවතා ච අම්හෙහි - සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

**භාවය**

අප විසින් රැස් කරන ලද මේ පුණ්‍ය සම්පත්තිය සියලු දෙවියෝ අනුමෝදන් වෙත්වා. ඔව්හු අපට සියලු සැප සම්පත් සිද්ධ කර දෙත්වා.

### ඥාතීන්ට පින් දීම :

ඉදං මෙ ඤාතීනං හොතු - සුඛිතා හොන්තු ඤාතයො

**භාවය**

මේ පිනෙන් (මියගිය) නෑයෝ සුවපත් වෙත් වා. (අනුන් සඳහා කියවන විට) 'ඉදං මෙ' වෙනුවට 'ඉදං වො' යනුවෙන් යොදන්න.

### ප්‍රාර්ථනාව :

ඉමිනා පුඤ්ඤකම්මෙන - මා මෙ බාලසමාගමො
සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා

**භාවය**

මේ පින්කමේ බලයෙන් මා හට අසත්පුරුෂ ආශ්‍රයක් නොවේවා. නිවන් දකිනා තුරු සත්පුරුෂයන්ගේ ම ආශ්‍රය ලැබේවා.

ඉදං මෙ පුඤ්ඤං ආසවක්ඛයාවහං හොතු සබ්බ දුක්ඛා පමුඤ්චතු

### භාවය

මේ පින මට නිවන් පිණිස හේතුවේවා. මම සියලු දුකින් මිදෙම්වා.

### ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා කමා කරවා ගැනීම

ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා කමා (ක්‍ෂමා) කරවා ගැනීම ආරාමීය වත්පිළිවෙතේ අනිවාර්ය ලක්ෂණයකි. දිනකට තුන්වාරයක් හෝ දෙ-වාරයක් වන්දනා සහ වත පිරිත කියා අවසානයේ සිය ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා ඉදිරියට ගොස් නමස්කාර කොට උන්වහන්සේලාගෙන් සමාව අයැදිය යුතු ය. රාත්‍රී හෝ දහවල් දවස පුරා තමන්ගෙන් යම් වරදක් වුවා නම් ඊට සමාව ඉල්ලීමටයි එලෙස කෙරෙන්නේ. ආචාර්ය/ උපාධ්‍යායන් වහන්සේලා ඉදිරියේ නොසිටින වේලාවන්හිදී උන්වහන්සේලා සිහිකරමින් හෝ මෙලෙස සමාව ගැනීම සිදු කළ යුතුය.

ශිෂ්‍යයා :- **ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ.**

ආචාර්යයන් වහන්සේ/ උපාධ්‍යායන් වහන්සේ :- **ඛමහං ඛමාමි.**

ශිෂ්‍යයා :- **ඔකාස ඛමාමි භන්තෙ.**

### භාවය

ශිෂ්‍යයා :- ස්වාමිනි, අවසරයි මා විසින් තුන් දොරින් කරන ලද සියලු වරදට කමා කරනු මැනවි.

ආචාර්යයන් වහන්සේ/ උපාධ්‍යායන් වහන්සේ :- යහපති, කමා කරමි.

ශිෂ්‍යයා :- අවසරයි ස්වාමිනි, කමා වෙමි.